## කෙටිකතාව

# රසිකයෙක් සහ කවියෙක්

ජයතිලක කම්මැල්ලවීර



මම කවියෙක්, ඔහු රසිකයෙක්.

ඔහු මට මුණගැසුණු පළමු දවසේ හැඳිනගැනීම එ සේ විය.

මුලින් ම ලොතරැයි කූඩුවක් ළඟදී අප මුණගැසුණු අවස්ථාවේදී මම කූඩුව ඉදිරිපිට ලොතරැයියක් මිළදී ගන්නට බලා සිටිද්දී ඔහු මට ලොතරැයි අලෙවි කරන්නට බලාගෙන ඒ කූඩුව තුළට වී සිටියේය. ලොතරැයිය ගැන මිස එය විකුණන්නා ගැන අවධානය යොමු කරන්නට තරම් විශේෂ හේතුවක් ඒ මොහොතේ මට නොතිබිණ.

"ඔබතුමාව මම අඳුනනව" ඒ මොහොතේ එතැන සිටියේ ඔහුත් මාත් පමණක් බැවින් මට පැහැදිලිව ඇසුණු ඒ වචන මා සම්බන්ධයෙන් ම කී බව වටහා ගත හැකි විය.

ලොතරැයියක් කඩා ගන්නට තැබූ අත එහෙම ම නවතා ගෙන මම ඔහු දෙස බැලුවෙමි. කිළිටි කමිසයක් හැඳි, තට්ට හිසෙහි සුදුපාට කෙස්කොට මතු වූ, හැටපැන්න කෙනෙක් යැයි බැලූ බැල්මට ම පෙනෙන ලොතරැයි වෙළෙන්දා, දඩියෙන් අවවර්ණ වුණු මුහුණ පැත්තකට ඇල කර ගෙන අපහසුවෙන් උපදවා ගත් සිනාවක් පානු පෙනිණ. මමත් හැට පැන්න කෙනෙක් නිසා මඟ තොටේ දකින වැඩිදෙනෙක් හැට පැනපු අය බවය කාලෙක සිට මට පෙනෙන්නේ.

කොඳු ඇට පේළියේ කිසියම් ආබාධයක් නිසා ඔහුගේ හිස අසාමාන්‍ය විදියට ඉදිරියට නැමී ඇත. මුහුණ පැත්තකට ඇල වී ඇත්තේ ද ඒ ආබාධය නිසා විය යුතු යයි මට සිතිණ. කියන්නේ බොරුවක් නොවන බව පෙන්වන හිනාව අස්සෙන් ඔහුගේ කටේ යටි ඇන්දේ දත් දෙකක් අඩු බවත් අනෙක් දත් ද අපිරිසිදු බවත් මම දුටුවෙමි.

කොතරම් කිලුට්ටෙකු වුව ද මේ මිනිහා මා හඳුනන බව කියයි. මේ කුඩා නගරය මා නිතර යන එන තැනක් නොවේ. අද මා, අවට ගෙවල් හතර පහෙන් ඔබ්බට විහිදෙන රැස්වළල්ලක් ඇත්තෙකු ද නොවේ. එවැනි තත්වයක් තුළ මේ තැනැත්තා මා හඳුනන බව කීමත් ඔහු එය කී ගරුසරු ආකාරයත් මගේ කුහුල ඇවිස්සුවේය.

"කොහොමද ඔයා මාව දන්නෙ?" කඩා ගන්නට ගිය ලොතරැයියට අත තබා ගෙන ම මම ඇසුවෙමි.

"මිස්ටර් මනුරත්නනෙ? ජයසිරි මනුරත්න."

ජේ. මනුරත්න වන මා ජයසිරි මනුරත්න වී සිටියේ බොහෝ කලකට පෙර ය. ඒ යුගය මට නිතර නිතර සිහි වෙන බව ඇත්තක් වුව ද මගේ පවුලේ අනෙක් කාටත් දැන් එය අමතක බව මම දනිමි. අසල්වාසීන් නම් එවැන්නක් ගැන දන්නේ ම නැත. එවැනි තත්වයක් තුළ මේ මිනිහා කලක් දිදුලපු නමින් ම මා හඳුනයි.

"ඔයා මාව හොඳට ම දන්නව එහෙනම්" මම කාලෙකින් කාටවත් නොපෑ සුහද සිනාවක් පෑවෙමි.
"මම ඒ දවස්වල ඔබතුමාගෙ කවි කියවල තියෙනව. සමහර ඒව මට කටපාඩම්"

මේ දැන් අත තබාගෙන සිටින ලොතරැයිය මට ඇදුනා සේ අමන්දානන්දයට පත් වූ මම එය කඩා ගත්තෙමි. රැකියාවෙන් විශ්‍රාම ගෙන ගෙදරට කොටුවීමෙන් ද ඇසුරු කළ යාළු මිත්‍රයන් එකා දෙන්නා මිය යාම නිසා ද පාළුවෙන් දවස ගෙවන කෙනෙකුට මඟතොටේදී හමු වන කෙනෙකු තමා හඳුනන්නේ යැයි කීම සතුට දනවන්නකි. රසිකයකු විසින් කවියකු හඳුනාගැනීම ඊට වඩා විසිතිස් ගුණයකින් ඉහළ සතුටකි. ඒ සතුට උපරිමයෙන් භුක්තිවිඳීමේ ලොබ සිතින් මම නිහතමානීකමක් පෙන්වීමි. "ඒ හුඟක් ඉස්සර ලියපුව."

ගැණුම්කරුවෙකු මගේ ඒ වචන හරස් කරමින් ලොතරැයි දහයක් ම මිලදී ගත්තෙන් අප අතර සංවාදය මොහොතකට බිඳ වැටිණ. එහෙත් රසිකයා සුළු ලාබයකට රසිකත්වය අත්හරින්නකු නොවන බව පෙන්නුවේය. "මිස්ටර් මනුරත්නගෙ කවි දෙවෙනි වෙන්නෙ කුමාරගමගෙ කවිවලට විතරයි. දිගට ම ලියන්න."
මගේ ගෙලෙහි මල්දමක් පැළඳුවා සේ විය. ඔහුගේ ඒ වචන ඇසුණු ලොතරැයි තෝරමින් සිටි තරුණියක් අප දෙදෙනා දෙස ම විමසුම් බැල්මක් හෙළුවාය. ඇගේ ඒ බැල්ම මට පෙනුනේ 'මෙයා නම් පත්තරේකට කවියක් දෙකක් ලියපු කෙනෙක් වෙන්න පුළුවන්, ඒත් මේ කිලුට්ට කොහොමද රසිකයෙක් වෙන්නෙ?' යැයි අසන්නක් හැටියට ය. කෙසේ වෙතත් ඇගේ බැල්මේ විමතියක් නැත්තේ වෙළෙන්දා කී ඒ වචන ඇයට හරියට නොවැටහුණු නිසා යැයි මම සිතුවෙමි. ඒවා හරියට තේරුම් ගන්නට නම් කුමාරගම කියන්නේ කවුදැයි වැටහීමක් තිබිය යුතුය. පාසල් ගුරුවරයකුව සිටි මම ඇයට කුමාරගම ගැන කියා දෙන්නට සිතද්දී ටියුෂන් පන්තියකට දුවන ශිෂ්‍යාවක සේ ඇය එතැනින් ඉවත් ව ගියාය.

"මම මාස තුනහතරකට කලින් මෙතනින් ස්වීප් එකක් ගත්ත මතකයි. ඒත් මට ඔයාව මතක නෑ."
"මේ කූඩුව අයිති අය දඹදිව වන්දනාවක ගිහින්. එනකල් මට බලා ගන්ඩ දුන්න."
"ඔයා පෙන්ෂන් ගත්තු කෙනෙක් වෙන්ඩ ඇති නේද?"
"ඒ දවස්වල පත්තරවල පළවෙච්ච ඔබතුමාගෙ කවිත් මම කපල අරන් තියාගෙන තිබුණ. ඒව ඔක්කොම ගංවතුරට ගියා." ඔහු කීවේ 'පුද්ගලික තොරතුරු නෙවෙයි අපි කවි ගැන කතාකරමු' යැයි කියන්නාක් මෙනි. මගේ සිතත් ගංවතුරකට අසුවී ගසාගෙන යන්නට විය.
'ගංවතුරට පමණක් නොවෙයි ජීවිතයේ නොයෙකුත් කුණාටු, සුළිසුළං, සුනාමි බොහෝ දේකට මුහුණ පෑ පෙනුමක් තිබුණත් ඔහු රසිකයෙක්. එසේ මෙසේ රසිකයෙක් නෙවෙයි කුමාරගමවත් අගය කරන රසිකයෙක්. කාලෙකින් මුණගැහුණු මේ රසිකයව අතහැරල යන්නෙ කොහොමද? මේ වගේ රසිකයෙක් එක්ක නිවී සැනසිල්ලෙ වාඩිවෙන්න තියෙනව නම් මොන තරම් දේවල් කතා කරන්න පුළුවන්ද?'

මම කවදත් කවි කියවන්ඩ කැමතියි.... ගන්ඩ ඔක්කොම අද අදින ඒව..... මේකට විස්සක් තියෙනව..... මේකට මොකුත් නෑ"

රසිකයාත් වෙළෙන්දාත් දෙදෙනා ම එකවර කතා කරන්නට විය. මට කතා කරන අතර ම ඔහු තවත් කීප දෙනෙකුට ම කතා කළේය.

ලෝකයේ තිබෙන හොඳම ව්‍යාපාරය ලොතරැයි වෙළඳාම යැයි සිතෙන තරමට ගැණුම්කරුවෝ අවුත් කූඩුව වටා රොද බැඳ ගත්හ. මා පසෙකට තල්ලු වූ නිසා ඔහු සමඟ කතා බහ කෙටිකරන්නට සිදුවුණත් "අපි වෙලාවක හම්බවෙලා ටිකක් කතා කරමු" යයි කියා ගන්නට මම සමත් වීමි.
කලකට පසු රසිකයෙක් මුණගැසීමේ ප්‍රීතියෙන් හිත පුරවාගෙන ගෙදර ගිය මා තුළ දිගින් දිගට ම මතුවුණු ලොතරැයි ගන්නට යෑමේ පෙළඹවීම සුළුපටු නො වී ය. තවමත් ඉතිරිව තිබෙන ආත්මාභිමානයෙන් එය සති දෙකක් අමාරුවෙන් යටපත් කරගත්තෙමි. තෙවැනි සතියේ දිනයක මා යන විට ඒ ලොතරැයි කූඩුව තුළ සිටියේ වෙනත් අයෙකි. විස්සේ කොළ එකතු කිරීම හැර වෙනත් කිසිම කතාවකට ඔහු සූදානම් නැති බව පෙනුණු බැවින් මගේ රසිකයා කොහේදැයි නොදැන ම මට ආපසු ගෙදර එන්නට සිදු විය.

බලාපොරොත්තු නොවූ අවස්ථාවක මුණගැසී සුළු කතාබහකින් පසු අතහැරුණු රසිකයා සොයාගැනීමට කවියා දැරූ වෙහෙස ගැන විස්තර කිරීම මෙතැනදී අත්හැර දමමි. කෙසේ වෙතත් ඔහු මට නැවත මුණගැසෙන්නේ ලොතරැයි කූඩුවක් තුළ නොව ඉන්ධන පිරවුම්හලකදීය. මම වම්පැත්තට බරවී ඉන්ධන මීටරය දෙස බලාගෙන ඉඳිද්දී ඔහු මගේ වාහනේ දකුණු පැත්තේ වීදුරුවට තට්ටු කළේය. ඇඳුමේ අපිරිසිදුකමත් මුහුණේ විඩාබර හිනාවත් එහෙම ම ය. ඔහුගේ හිස තවත් ටිකක් පහතට නැමී ඇති බවකි පෙනුණේ. ඔහු අත පොඩි ලෑලි කෑල්ලකි. ඒ ලෑලි කෑල්ලේ ලොතරැයිපත් කීපයකි. ඉන්ධන පුරවා ගැනීම සඳහා මගේ වාහනයට පිටුපසින් වාහන පෝළිමකි. මොහොතක් පමා වුවහොත් කෝපය හඟවන නලා හැඬවිල්ල පටන් ගනු ඇත. එය අතින් පයින් පහර දෙනවාට වඩා රිදවීමකි. ලොතරැයියක් මිල දී ගෙන "අපි වෙලාවක හම්බ වෙමු" කියා කියනු හැර වෙනත් කතාබහකට එතැන ඉඩක් තිබුණේ නැත.

තුන්වැනි වතාවට මට මගේ රසිකයා මුණගැසෙන්නේ මාස හත අටකට පසුව ය. ඔහු සිටියේ කඩමණ්ඩියේ කඩයක් ඉදිරිපිට පඩියක වාඩිවීගෙන ය. බෙල්ලෙන් ඉදිරියට නැමුණු හිස හොඳට ම පාත් වී ඇති බැවින් තමා ඉදිරියේ සිටින්නන් දෙස ඔහු බලන්නේ අමාරුවෙනි. එක් කකුලක වළලුකර ලොකුවට වෙලාගෙන සිටිනු පෙනේ. වාහනයෙන් බැස එන මා දුටු විට ඔහු අමාරුවෙන් නැගී සිටියේ ය. මුහුණ ඇලකරගෙන යන්තමින් සිනාසුණෝ ය.

'මොකද මෙතන? දැන් ස්වීප් වෙළඳාම නැද්ද?' මගේ ඒ ප්‍රශ්නයට ඉඩ නොදී ඔහු කතා කරන්නට විය.

"මිස්ටර් මනුරත්න. මට ඊයෙත් ඔබතුමාගෙ කවියක් මතක් වුණා. මම හුඟක් ආස කවියක්. අර අනංගයාට ලියුමක් කවි පන්තිය."

ඔහුගේ පෙනුම සහ ඉරියව්ව මා කම්පාවට පත් කළ බැවින් ඔහු කියන දෙයින් සතුටු වෙන්නට මට නොහැකි විය. 'මේ මනුස්සය හිඟමනට බැහැලද?' මට එ සේ සිතිණ.

"මොකද කකුල?"
"කහල වන වෙලා."
"බෙහෙත් ගත්තෙ නැද්ද?"
"දවසක් දෙකක් ගත්ත. ඒකට වඩා දැන් මට හුඟක් අමාරු මේ බෙල්ල." ඔහු අමාරුවෙන් අතක් උස්සා නැවුණු බෙල්ල අතගෑවේය.
"ඒකට ප්‍රතිකාරයක් ගත්තෙ නැද්ද?"

"මුලින්ම දැනුනු දවස්වල ඉස්පිරිතාලෙට ගිහින් පෙන්නුව. පරීක්ෂණ වගයක් කරන්න වෙයි කිව්ව. වෙදමහත්තයෙකුගෙන් තෙල් ගෑව. වැඩක් උනේ නෑ. එන්ඩ එන්ඩ වැඩිවුණා. මිස්ටර් මනුරත්න දැන් කවි ලියන්නෙ නැද්ද?"
"දැන් කාලෙකින් ලියවුනේ නෑ.... මේ වෙලාවෙ මට පුළුවන් විදිහට ඔයාට පොඩි උදව්වක් කරන්ඩද?" මා එ සේ ඇසුවේ ඔහු යාචකයෙක් බවට පත් ව සිටින්නේ ද යන්න දැන ගැනීමට ය.
ඔහු පෑ සිනාවේ යාචක පෙනුමක් තිබුණු බැවින් මම රුපියල් සියයක් ඔහු අතට දුන්නෙමි.

"නවත්තන්ඩ එපා මිස්ටර් මනුරත්න. දිගටම කවි ලියන්ඩ."
මට ඒ වචන ඇසුණේ 'යාචකයෙක් හැටියට මා දිහා බලන්ඩ එපා මම රසිකයෙක්' කියා

